**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2015**

---

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (බී.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. කොළඹ ජල ද්‍රෝණිය පෝෂක ප්‍රදේශයේ ජලගැලීම් අඩු කිරීමට හා තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශීය යටිතල හා සේවා පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 42,031.74 කට සමාන එජඩො මිලියන 321 ක් වන අතර ඉන් එජඩො මිලියන 213 ක් හෙවත් සියයට 66.35 ක් මූල්‍යායනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2016 මාර්තු 31 ට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 ජුලි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

#### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------------

2012 දෙසැම්බර් 10 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 48 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ විශේෂ දීමනා ගෙවීම සඳහා අනෙකුත් දීමනා හැර නිලධාරීන්ගේ මූලික වැටුප පදනම් කර ගත යුතුය. කෙසේ වුවද ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ අනෙකුත් දීමනා ඇතුළත් දළ වැටුප පදනම් කරගෙන විශේෂ දීමනා ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 10.83 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍ර සං ජා බැ | 213.00 | 27,890.22 | 5,300.00 | 18.80 | 2,556.00 | 64.00 | 8,517.00 |
| ශ්‍රී ලං ර | 108.00 | 14,141.52 | 1,800.00 | 3.40 | 466.00 | 12.80 | 1,700.00 |
| එකතුව | 321.00 | 42,031.74 | 7,100.00 | 22.20 | 3,022.00 | 76.80 | 10,217.00 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඉලක්ක ඉටුකරගැනීම සඳහා වගකීම් දක්වමින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ 3 ½ ක් ඉකුත් වීමෙන් පසුවත් එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම කරුණ හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතිය විසින් ඉටුකර ගන්නා ලද තථ්‍ය කාර්යසාධනය තහවුරු කරගත නොහැකි විය.

(ආ) ඉහත තොරතුරු අනුව, රු.මිලියන 27,890 කට සමාන එජඩො මිලියන 213 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 30 ක් නියෝජනය වන රු.මිලියන 8,517 කට සමාන එජඩො මිලියන 64 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 1 ½ ක කාල පරිච්ඡේදය තුළ එජඩො මිලියන 149 ක ඉතිරි අරමුදල් උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතය.

**3.2 භෞතික ප්‍රගතිය**

**-------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, කොළඹ ජල ද්‍රෝණියේ ජල ගැලීම් අවදානම අවම කිරීම සඳහා උප සංරචක 12 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද රු.මිලියන 3,822.68 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සිදුකිරීමට සැලසුම් කර තිබූ ජලාපවහන පද්ධති හා ඇළ මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩ 14 ක් සමාලෝචිත වර්ෂය තුළ අත්හැර දමා තිබුණි. තවද රු.මිලියන 6,403 ක පිරිවැයකට ඇස්තමේන්තු කර තිබූ පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීම් වැඩ 07 ක් සැලසුම් අදියරේ පැවති අතර වෙනත් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් වැඩ 09 ක් පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2015 දෙසැම්බර් 31 දිනටද ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ආ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, බේරේ වැව දිගේ ලයිනර් පාර්ක් (Liner Park) ඉදිකිරීම හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා ප්‍රදේශයේ යටිතල සංවර්ධන වැඩ පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 10 ක් සහ සියයට 11 ක් තරම් අඩු මට්ටමක විය. තවද ග්‍රෙගරි ඇලේ පුනරුත්ථාපන කාර්යයන් හා කාක දූපත වෙරළ උද්‍යානය (Crow Island Beach Park) ඉදිකිරීම් වැඩ පිළිබඳ භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 84 ක් හා සියයට 100 ක් ලෙස ඉලක්ක කර තිබුණද එය පිළිවෙලින් සියයට 51 ක් හා සියයට 77 ක් විය. ඊට අමතරව, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතන සඳහා නාගරික සංවර්ධන යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා ධාරිතා වර්ධනය පිළිබඳ සංරචකය යටතේ පොදු පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ භෞතික ප්‍රගතිය 2015 දෙසැම්බර් 31 දිනට සියයට 94 ක ඉලක්කයක් ඉටුකර ගැනීමට අපේක්ෂා තිබුණද, සියයට 44 ක භෞතික ප්‍රගතියක් වාර්තා කර තිබුණි. ඉහත සඳහන් පරිදි කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති කාර්යයන් අඩු ප්‍රගතියක් අත්විඳිමින් තිබුණද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. ව්‍යාපෘති කාර්යයන් නියාමනය කිරීමට හැකිවන පරිදි ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම් සහ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් ආදිය නියමිත පරිදි පවත්වා නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස පසු විපරම් කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. 2012 වර්ෂයේ සිට ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා අර්ධකාලීන පදනම මත පත්කර තිබූ බවත් ව්‍යාපෘති කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඔහුගේ සම්පූර්ණ ධාරිතාවය හා කාලය යොදා නොතිබූ බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා වැඩ පිළිබඳ විධිමත් සැලසුම් සහ ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 7,361 ක ඇස්තමේන්තු පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත් 22 ක් රු.මිලියන 6,441 ක පිරිවැයකට පමණක් නිම කිරීමට හැකිව තිබුණි. එබැවින් ඒ සඳහා වැඩ පූර්ව අත්තිකාරම් වැඩියෙන් ඇස්තමේන්තු කරන ලද කොන්ත්‍රාත් පිරිවැයට මුදා හැර තිබුණු හෙයින් එහිදී කොන්ත්‍රාත්කරුවන්ට නොලැබිය යුතු මූල්‍ය වාසි සඳහා අවස්ථා ඇති කර තිබුණි. තවද බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානයේ වැඩ විෂය පථය සැලකිය යුතු ලෙස වෙනස් කර තිබූ අතර රු.මිලියන

202 ක පිරිවැයට ඇස්තමේන්තු කරන ලද වැඩවලින් රු.මිලියන 48 කට ඇස්තමේන්තුගත පිරිවැයට වූ වැඩ අඩු කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ කිරීමේ ධාරිතාවය ව්‍යාපෘතිය විසින් සලකා බලා නොතිබූ බව නිරීක්ෂණය වූ අතර එම කොන්ත්‍රාත්කරුවන්ටම කොන්ත්‍රාත් කිහිපයක් පිරිනමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කාලය දීර්ඝ කිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන්ට නිතර ඉඩ ලබා දී තිබුණි. ලැබුණු තොරතුරු අනුව, රු.මිලියන 374 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත් 06 ක් යටතේ වැඩ නිම කිරීම සඳහා දින 22 සිට දින 114 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. තවද රු.මිලියන 1,620 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ත්‍රාත් 05 ක් පිරිනමන ලද වෙනත් කොන්ත්‍රාත්කරුවන් සඳහා දින 117 සිට දින 209 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 4,724.09 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පිරිනමන ලද කොන්ත්‍රාත් 09 ක යෙදී සිටි වෙනත් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු සඳහා දින 98 සිට දින188 දක්වා කාලය දීර්ඝ කිරීම්ද ලබා දී තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යසාධන වාර්තාව හා ප්‍රසම්පාදන සැලැස්ම අනුව, යටිතල පහසුකම් සංවර්ධනයන් පිළිබඳ උපදේශක කාර්යයන්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධති හා නැවත පදිංචි කිරීමේ සැලසුම් ආදිය නිම කිරීමට එකඟ වූ දිනයන්හි සිට වර්ෂ 1 ½ සිට වර්ෂ 2 ½ දක්වා වූ ප්‍රමාදයන්ගෙන් පසුව, 2015 දෙසැම්බර් 31 දිනට නිම කර නොතිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

---------------------------------

තරඟකාරී මිල ගණන් කැඳවීමෙන් තොරව, කොළඹ නගරයේ ජලගැලීම් පාලනයන් හා ජලාපවහන පද්ධති පිළිබඳ සැලසුම් කාර්යයන් සඳහා රු.මිලියන 33.88 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් එකිනෙකට වෙනස් පරිගණක මෘදුකාංග පැකේජ 02 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වුවද රු.මිලියන 19.35 ක පිරිවැයකට 2012 මාර්තු 12 දින ප්‍රසම්පාදනය කරන ලද මෘදුකාංග පැකේජ, කොළඹ මහ නගර සභාව විසින් සකස් කරන ලද පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් එදින සිට නිෂ්කාර්යව පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජල ගැලීම් පාලනය හා ජලාපවහන පද්ධති පිළිබඳ සැලසුම් කාර්යයන් සැලසුම් කරන ලද දිනයේ සිට වර්ෂ 02 ක් ඉකුත්වීමෙන් පසුවත් ආරම්භ කර නොතිබුණි.

## 3.5 පරිබාහිර කාර්යයන්

-----------------------

කුඩා වැන්රිය (Utility Vehicles) ප්‍රසම්පාදනය කිරීම සඳහා ණය නියෝජිතායතනයෙන් අනුමැතිය ලැබී තිබුණද ව්‍යාපෘතිය විසින් රු.මිලියන 59.14 ක පිරිවැයකට මෝටර් වාහන 02 ක් හා සුඛෝපභෝගී පහසුකම් සහිත මගී බස්රථයක් ප්‍රසම්පාදනය කර තිබුණි. ඉන් එක් මෝටර් වාහනයක් රේඛීය අමාත්‍යාංශයේ භාවිතය සඳහා මුදාහැර තිබුණි. රාජ්‍ය සංස්ථාවක භාවිතය සඳහා මගී බස්රථය මුදා හැර තිබූ අතර සංස්ථාවේ සේවක සුභසාධන කාර්යය සඳහා අදාළ බස්රථය භාවිතා කර තිබූ බව අනාවරණය විය.